කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 01 WW/TC/21/10/27/01
වර්ණය : ඇම්බර්

# දකුණු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින අඩු පීඩන තත්ත්වය පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2021 ඔක්තෝබර් මස 27 වන දින ප.ව. 04.30 ට නිකුත් කරන ලදී. (ඉදිරි පැය 24 සඳහා)

## ගොඩබිම් ප්‍රදේශ සහ දකුණු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය සඳහා

සැලකිලිමත් වන්න!

- දකුණු දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පැවති පහළ වායු ගෝලයේ කැළඹිලි තත්ත්වය අඩු පීඩන තත්වයක් දක්වා වර්ධනය වී ඇත. මෙම පද්ධතිය ආසන්න වශයෙන් බස්නාහිර දෙසට ගමන් කර ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ දෙසට ගමන් කිරීමට ඉඩ ඇත. ඉදිරි දින කිහිපයේ දී එය දිවයිනේ සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල කාලගුණය කෙරෙහි බලපෑම් ඇති කරනු ඇත.




## ගොඩබිම් ප්‍රදේශ සඳහා:

- විශේෂයෙන් ඔක්තෝම්බර් මස 28, 29 සහ 30 යන දිනවල, දිවයිනේ වැසි තත්ත්වයේ වර්ධනය වීමක් අපේක්ෂා කෙරේ.

## මුහුදු ප්‍රදේශ සඳහා:

- පුත්තලම සිට කන්කසන්තුරේ, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල වැසි සහ සුළං තත්ත්වය වැඩි වේ.

- ඉදිරි කාලගුණ අනාවැකි පිළිබඳව අවධානයෙන් සිටින ලෙස නාවික සහ ධීවර ප්‍රජාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.